# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2024

## කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
## DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
**Ministry of Finance, Planning an Economic Development**


| | | |
|---|---|---|
| මහලේකම් කාර්යාලය | செயலகம் | The Secretariat |
| කොළඹ 01 | கொழும்பு 01 | Colombo 01 |

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි උපදෙස්වලට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

**කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව**

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**මහලේකම් කාර්යාලය**

**කොළඹ 01**

**2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
**ආයතනයේ නම : කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව**
**වැය ශීර්ෂ අංකය : 324**

<u>පටුන</u>


| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1-5 |
| පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 6-8 |
| පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 9-20 |
| පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක | 21-23 |
| පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 24-28 |
| පරිච්ඡේදය 06 - අවදානම් කළමනාකරණ රාමුව | 29-33 |
| පරිච්ඡේදය 07 - මානව සම්පත් පැතිකඩ | 34-38 |
| පරිච්ඡේදය 08 - අනුකූලතා වාර්තාව | 39-47 |

# පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

2008.01.25 දිනැති අංක 08/0200/306/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස 2008.02.01 දින ස්ථාපනය කර ඇති අතර, භාණ්ඩාගාරය විසින් රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත මුදාහරිනු ලබන අරමුදල් ඵලදායි ලෙස යෙදවීම තහවුරු කිරීම සඳහා වන අභ්‍යන්තර පාලන විධි ශක්තිමත් කිරීම මෙහි අරමුණ වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### 1.2.1. දැක්ම

ඉහළ කාර්ය සාධනයක් සහ වගකීම් සහගත රාජ්‍ය සේවයක් අභිවර්ධනය කිරීම සඳහා කැප වූ, අඛණ්ඩව අගය එකතු කරන විශිෂ්ටතම විගණන කළමනාකරණ සහ අධීක්ෂණ ආයතනය බවට පත්වීම.

### 1.2.2. මෙහෙවර

අභ්‍යන්තර පාලනය සහ ක්‍රියාවලි ශක්තිමත් කිරීම මගින් අපේක්ෂිත කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය අංශයට මාර්ගෝපදේශ සහ සහාය ලබා දීම.

**අරමුණු**

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි කාර්යක්ෂතාවය සහ ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා දායකවීම.

2. විගණන හා කළමනාකරණ කමිටු මඟින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.

3. අභ්‍යන්තර විගණනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දීම.

4. සංවර්ධන ව්‍යාපෘතීන්හී කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

5. විශේෂ විමර්ශන හරහා රාජ්‍ය අංශයේ සිදුවී ඇති අක්‍රමිකතා හෙළිදරව් කිරීම සහ එවැනි අක්‍රමිකතා අනාගතයේදි ඇතිවීම වළක්වා ගැනීම හා එවැනි තත්ත්වයන් මගහැර ගැනීම සඳහා වැළැක්වීමේ පියවර සහ නිර්දේශ හඳුන්වා දීම.

## 1.3 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යයන්

1. කාර්යක්ෂම හා සඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රියාවලි හඳුන්වාදීම.
2. අභ්‍යන්තර පාලනය සම්බන්ධ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම.
3. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය කිරීම හා ඊට අදාළ මඟපෙන්වීම් ලබා දීම.
4. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.
5. අමාත්‍යාංශ,විශේෂ වියදම් ඒකක,පළාත් සභා,දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල සහ ව්‍යාපෘති අභ්‍යන්තර සමාලෝචන කමිටුවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම සහ මඟපෙන්වීම.
6. විශේෂ විමර්ශන හා විශේෂ විගණන කටයුතු සිදුකිරීම.
7. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ භාණ්ඩාගාර වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම.
8. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ හා අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම.
9. දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

## 1.4 2024.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(COPA/FIN)- අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා සම්බන්ධීකරණ හා මූල්‍ය)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(AMC) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණය)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(GEN AD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පරිපාලන)

අධ්‍යක්ෂ (SOE) - අධ්‍යක්ෂ (රාජ්‍ය ව්‍යාපාර)
අධ්‍යක්ෂ(PCC) - අධ්‍යක්ෂ(පළාත් සභා සම්බන්ධීකරණ)
අධ්‍යක්ෂ (HRD) - අධ්‍යක්ෂ(මානව සම්පත් සංවර්ධනය)
අධ්‍යක්ෂ (RIAR) - අධ්‍යක්ෂ(අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය )
අධ්‍යක්ෂ(ADM) - අධ්‍යක්ෂ(පරිපාලන)
අධ්‍යක්ෂ (LFP/FFP) - අධ්‍යක්ෂ 1 (ව්‍යාපෘති - දේශීය හා විදේශීය අරමුදල් )
අධ්‍යක්ෂ (LFP/FFP) - අධ්‍යක්ෂ 2 (ව්‍යාපෘති - දේශීය හා විදේශීය අරමුදල් )

නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(COPA) - නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා සම්බන්ධීකරණ)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ((FIN) - නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(මූල්‍ය)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(HRD) - නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(මානව සම්පත් සංවර්ධනය)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(AMC) - නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණය)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(ADM) - නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(පරිපාලන)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ(FFP/ INV) - නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති - විදේශීය අරමුදල් හා විමර්ශන)

## 1.5 2024.12.31 දිනට කාර්ය මණ්ඩලය

| තනතුර | කාර්ය මණ්ඩලය | | |
|---|---|---|---|
| | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
| අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ග.සේ. විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය) | 01 | - | 01 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ග.සේ. විශේෂ ශ්‍රේණිය.) | 02 | 01 | 01 |
| අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.) | 01 | 01 | - |
| අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ග.සේ.) | 04 | 03 | 01 |
| අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ.) | 02 | 02 | 00 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.) | 01 | - | 01 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ග.සේ.) | 04 | 02 | 02 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ.) | 01 | 01 | - |
| සංවර්ධන නිලධාරී | 09 | 09 | - |
| කළමනාකරණ සේවා නිලධාරී | 14 | 12 | 02 |
| රියදුරු | 04 | 02 | 02 |
| කාර්යාල සේවක සේවය | 06 | 04 | 02 |
| **එකතුව** | **50** | **38** | **12** |

## 1.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ❖ විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණ අංශය

  (a) රජයේ ආයතන වල විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණය

  (b) ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණය

  (c) අභ්‍යන්තර විගණන ධාරිතා සංවර්ධනය

- ❖ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා සම්බන්ධීකරණය

- ❖ පාලන අංශය

  (a) ආයතන හා පරිපාලන කටයුතු

  (b) විශේෂ විමර්ශන සම්බන්ධීකරණය

- ❖ ගිණුම් අංශය

## පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 නව්‍යකරණය වූ රාජ්‍ය අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වසර 16 ක් පුරා රාජ්‍ය අංශයේ මූල්‍යමය වගවීම ඉටු කිරීම වෙනුවෙන් විවිධ වූ ප්‍රගමන ක්‍රියාමාර්ග ගෙන ඇත. මුදල් රෙගුලාසි 133 අනුව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ මේ වනවිට රාජ්‍ය මූල්‍ය පාලනය ශක්තිමත් කිරීම හා ප්‍රශස්ත පිරිවැයක් යටතේ උපරිම මහජන සේවයක් ලබා දීමට අවශ්‍ය මගපෙන්වීම විගණන හා කළමනාකරණ කමිටු හරහා සිදු කරන අතරම, උපදේශනාත්මක හා අධීක්ෂණ සේවයක් ද ඉටු කරනු ලබයි. එහිදී විවිධ රාජ්‍ය ආයතන මඟින් චක්‍රලේඛ, නීති උපදෙස්වලට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කෙරෙන අතර අවශ්‍ය අවස්ථාවලදී උචිත අභ්‍යන්තර පාලනක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කර ඇත.

2024 වසරේ අමාත්‍යාංශ, විශේෂ වියදම් ඒකක, පළාත් සභා, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ව්‍යාපෘති කාර්යාල හා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සලසන රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ/ අභ්‍යන්තර විගණකවරුන්ගේ සහ විගණන කාර්ය මණ්ඩලවල කාර්ය සාධනය සහ කුසලතා වර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමුකොට කාලීනව වැදගත් ක්ෂේත්‍ර කිහිපයක පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර එමගින් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ / අභ්‍යන්තර විගණකවරුන්ගේ සහ විගණන කාර්ය මණ්ඩලවල ධාරිතාව සංවර්ධනයට අවශ්‍ය පියවර ගන්නා ලදි. විශේෂයෙන් අභ්‍යන්තර විගණනයට සම්බන්ධ සියලුම නිලධාරීන් ආවරණය කල හැකිවන පරිදි පළාත් සභා මට්ටමෙන් අදාළ පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ සියලුම ආයතනයන්හි පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

ඇතැම් සංවර්ධන ව්‍යාපෘතීන්හි දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හා විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අපේක්ෂිත කාර්ය සාධනයක් ළඟා කර ගැනීමට නොහැකි වී ඇති බව ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම්වලදී මෙන්ම ව්‍යාපෘති ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතුවලදී නිරීක්ෂණය විය. ඒ අනුව අභ්‍යන්තර පාලන ක්‍රමවේද වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම තුලින් වඩාත් ඵලදායි ව්‍යාපෘති කළමනාකරණයක් උදෙසා මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමනාකරණය හා සම්බන්ධිත සියලුම දෙපාර්තමේන්තුවල පොදු එකඟතාවයකින් යුතුව ව්‍යාපෘති කළමනාකරණය ආශ්‍රිත සවිස්තරාත්මක මාර්ගෝපදේශයක් (කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/02/2024 -ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය) සකස් කර නිකුත් කිරීමට 2024 වසර තුළ කටයුතු කරන ලදි.

2024 වර්ෂයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා 47 ක් පැවැත්වීම සඳහා නිර්දේශ වී තිබුණද විවිධ හේතූන් නිසා එයින් කාරක සභා 07 ක් අවලංගු වී ඇත. ඒ අනුව තත්‍ය ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් 36 ක් පවත්වා ඇති අතර ඒ සඳහා මහා භාණ්ඩාගාර වාර්තා යැවිය යුතුව තිබූ සියළුම වාර්තා මහා භාණ්ඩාගාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සඳහා සක්‍රිය දායකත්වයක් ලබාදෙනු ලබන දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් යවා ඇති අතර පැවැත්වූ කාරක සභා 36 සඳහාම දෙපාර්තමේන්තුව සක්‍රියව සහභාගී වී ඇත.

රාජ්‍ය ආයතන තුල සිදුව ඇති දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වයන් විසින් 2024 වර්ෂය තුල කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි 71 ක් යොමු කර ඇති අතර, එම පැමිණිලිවලින් සිදුවිය හැකි බලපෑමේ ප්‍රමාණයට ප්‍රමුඛතාවය ලබා දෙමින් වඩාත් වැදගත් විමර්ශන මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට පැවරීමට කටයුතු කර ඇත. එයට අමතරව ඇතැම් විමර්ශන අදාල ආයතනයන්හි අභ්‍යන්තර විගණන අංශ වෙත යොමු කර ඔවුන්ගේ විමර්ශන වාර්තා පදනම් කර ගනිමින් මෙම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සහිතව අදාල පාර්ශ්ව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව අප දෙපාර්තමේන්තුව වෙත 2024 වර්ෂයේ ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 2024.12.31 දින වන විට පැමිණිලි 45 කට අදාල විමර්ශන ගොනුවල කටයුතු අවසන් කර ඇති අතර, අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල අභ්‍යන්තර විගණන අංශ වෙත යොමු කර ඇති ඇතැම් පැමිණිලි සම්බන්ධ විමර්ශන සිදු කරමින් පවතියි.

එමෙන්ම රාජ්‍ය අංශයේ සංවිධානවල අරමුණුවලට බලපෑම් කලහැකි අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් ලෙස අවදානම් කළමනාකරණ රාමුවක් දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කර DMA/1-2024 චක්‍රලේඛය යටතේ හඳුන්වාදෙන ලදි. මෙමගින් පාලනය, මෙහෙයුම් අනුකූලතාවය, මූල්‍ය සහ කීර්තිනාමයට අදාළ අවදානම් ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම, වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සහතික කරනු ලබයි. මෙමගින් රාජ්‍ය අංශයේ ආයතනවල අවිනිශ්චිතතාවයන් කල්තියා කළමනාකරණය කිරීමට උපකාරිවන අතර අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීමත් අවදානම් අවම කර ගැනීමත් සහතික කරයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය අනුව එම පනතේ 41 (2) උප වගන්තිය යටතේ සඳහන් සියලුම ආයතනවල අභ්‍යන්තර විගණන වාර්තා මෙම දෙපාර්තමේන්තුවට ලබාගෙන තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු විගණන වාර්තා සම්බන්ධව දෙපාර්තමේන්තු නිලධාරින් මගින් අදාළ විගණන හා කළමනාකරණ කමිටු වලදී අවශ්‍ය මඟපෙන්වීම් ලබා දීමට කටයුතු කර ඇත. 2024 වසර තුලදී, අමාත්‍යාංශ, පළාත් සභා, විශේෂ වියදම් ඒකක, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යලයන්හි අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ සමාලෝචන රැස්වීම් 28 ක් සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ප්‍රතිපාදන මත කටයුතු කරන රාජ්‍ය ව්‍යවසායන් සඳහා සමාලෝචන රැස්වීම් 11 ක් පවත්වා අභ්‍යන්තර විගණන කටයුතුවල ඵලදායීතාවය පරීක්ෂාවට ලක් කරන ලද අතර ඒවායේ පැවති අඩු ලුහුඬුතා පිළිබඳව ඒ ඒ අභ්‍යන්තර විගණකවරුන් වෙත වාර්තා කිරීමට කටයුතු කරන ලදී.

ජාතික විගණන පනතේ 38(1) හි (ඇ) අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියකු හෝ ගණන්දීමේ නිලධාරියකු විසින් තම ආයතනය සම්බන්ධයෙන් සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කලට සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යෑම සඳහා අවශ්‍ය වෙනස්කම් සිදුකළ යුතුය. ඒ අනුව මෙම අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම සහ ඊට අනුරූපව අවශ්‍ය පාලන පද්ධති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීමට හැකිවන පරිදි DMA/1-2024 අවදානම් කළමනාකරණ චක්‍රලේඛය යටතේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදි.

## 2.2 අනාගත ඉලක්ක

2.2.1 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වගන්තියට අදාළ රෙගුලාසි පිළියෙළ කිරීම 2025 පළමු අර්ධ වර්ෂය තුල නිම කිරීමට අපේක්ෂා කෙරේ.

2.2.2 ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ දැනුම, කුසලතා තවදුරටත් වර්ධනය කිරීම සඳහා සහ අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දැනුම සහ හැකියාව වැඩිදියුණු කිරීමට නිරන්තර පුහුණු වැඩසටහන් කොළඹදී සහ පළාත් සභා මට්ටමෙන් පවත්වා ශක්තිමත් හා ගුණාත්මක කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

2.2.3 අවදානම් කළමනාකරණය සඳහා වන අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ පුහුණු වැඩ සටහන් 2025 වර්ෂය තුලදී පැවැත්වීමට සහ එය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමසීමට කටයුතු සැලසුම් කර ඇත.

2.2.4 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019.01.12 දිනැති අංක DMA/01-2019 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය සහ තවත් චක්‍රලේඛ කිහිපයක් අවලංගු කර අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම පිළිබඳ අංග සම්පූර්ණ මහපෙන්වීමක් නිකුත් කිරීමට සැලසුම් කර ඇත. එය 2025 මුල් අර්ධ වර්ෂය තුලදී නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී.

2.2.5 ව්‍යාපෘති කළමනාකරණයට අදාළව නිකුත්කල DMA/02-2024 මහපෙන්වීමට අදාළව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සලකා බැලිය යුතු කරුණු පිළිබඳ පිරික්සුම් ලැයිස්තුවක් සංවර්ධනය කිරීම සහ එය 2025 වසර මැද භාගයේ නිකුත් කිරීමට අපේක්ෂිතය.

2.2.6 අභ්‍යන්තර විගණකවරුන් සඳහා වාර්ෂික විගණන සැලැස්ම පිළියල කිරීම,විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වාර්තා පිළියල කිරීම හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව හා සම්බන්ධවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසාදීමේ අරමුණින් ජාලගත අභ්‍යන්තර විගණන කළමනාකරණ පද්ධතියක් 2025 වර්ෂය තුල සංවර්ධනය කර ක්‍රියාවට නැංවීමට සැලසුම්කර ඇති අතර එහි පද්ධති අවශ්‍යතා හඳුනා ගැනීම දැනටමත් නිමකර ඇත.

(signature)

දෙපාර්තමේන්තු ප්‍රධානී

2025.06. 20

පරිච්ඡේදය 03- වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1

ඒසීඒ-එෆ්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 | | සටහන | සත්‍ය 2024 | සත්‍ය 2023 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 63,446,000 | 56,562,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 370,387 | 137,591 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 3,519,926 | 4,017,317 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **67,336,313** | **60,716,907** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **67,336,313** | **60,716,907** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 118 | 912,674 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **67,336,195** | **59,804,233** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 46,515,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 45,793,752 | 39,449,521 | ඒසීඒ-2(ii) |
| 17,165,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 16,553,309 | 16,469,604 | ඒසීඒ-2(ii) |
| 800,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 669,017 | 724,457 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **64,480,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **63,016,078** | **56,643,582** | |
| | **ප්‍රාග්ධන වියදම්** | | | | |
| 1,153,000 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 1,064,444 | 678,945 | ඒසීඒ-2(ii) |
| 977,000 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 975,860 | 30,000 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 1,720,000 | හැකියා වර්ධනය | 14 | 1,062,775 | 979,313 | ඒසීඒ-2(ii) |
| | වෙනත් ප්‍රාග්ධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| **3,850,000** | **මුළු ප්‍රාග්ධන වියදම් (උ)** | | **3,103,079** | **1,688,258** | |
| | තැන්පතු ගෙවීම් | | 370,387 | 137,591 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 3,562,934 | 3,796,770 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **3,933,321** | **3,934,361** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **70,052,478** | **62,266,201** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(2,716,283)** | **(2,461,968)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | **(2,716,283)** | **(2,461,968)** | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | | | **(2,716,283)** | **(2,461,968)** | |

3.2

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 31,989,231 | 32,082,576 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 6,556,221 | 6,513,213 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **38,545,452** | **38,595,789** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 6,556,221 | 6,513,213 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 31,989,231 | 32,082,576 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **38,545,452** | **38,595,789** |

පිටු අංක 07 සිට 22 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 23 සිට 28 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ . මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත . ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා , ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු .

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු .

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ගණකාධිකාරී |
| නම : කේ.එම්. මහින්ද සිරිවර්ධන | නම : ඒ.පී. කුරුම්බලපිටිය | නම :පී.ඒ.පී.ටී. ගනේපොල |
| තනතුර : ලේකම්, මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් | තනතුර : නි. අධ්‍යක්ෂ |
| දිනය : 2025.02. 27 | දිනය : 2025.02. 21 | දිනය : 2025.02. 20 |

කේ.එම්.මහින්ද සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ඒ.පී. කුරුම්බලපිටිය
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

පී.ඒ.පී.ටී. ගනේපොල
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

3.3

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සටහන | | |
|---|---|---|---|
| | | **2024**<br>රු. | **2023**<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 2,338,508 | 2,315,642 |
| අග්‍රිම ලැබීම් | | 63,446,000 | 56,562,000 |
| අන්තිකාරම් අයකර ගැනීම් | | 3,161,809 | 3,765,270 |
| තැන්පතු ලැබීම් | | 370,387 | 137,591 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **69,316,704** | **62,780,502** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 62,053,311 | 55,520,751 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 669,017 | 724,457 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 322,517 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 118 | 912,674 |
| අන්තිකාරම් ගෙවීම් | | 3,562,934 | 3,796,770 |
| තැන්පතු ගෙවීම් | | 370,387 | 137,591 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **66,978,284** | **61,092,244** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **2,338,420** | **1,688,258** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| මූලධන වියදම් | | 2,338,420 | 1,688,258 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **2,338,420** | **1,688,258** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(2,338,420)** | **(1,688,258)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **-** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | **-** | **-** |
| | | - | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | **-** | **-** |

3.4

**වාර්තාකිරීමේ පදනම**

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනියව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

**රු. 000**

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %ලෙස |
| | අදාල නොවේ. | | | | |

**3.6** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

**රු. 000**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන ,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 61,655 | 64,480 | 63,016 | 98 % |
| | | | | |
| | | | | |
| ප්‍රාග්ධන | 3,500 | 3,850 | 3,103 | 81 % |
| | | | | |
| | | | | |

**3.7** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

**රු. 000**

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | අදාල නොවේ. | | | | | |
| | | | | | | |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

**රු. 000**

| වත්කම් කේතය | කේත විස්තරය | **2024 12.31.** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2024.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය වාර්තා කිරීම % ලෙස |
|---|---|---|---|---|---|
| | | | | | |
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 0 | 0 | 0 | 0 |
| | | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 31,989 | 31,989 | 0 | 100% |
| | | | | | |
| 9153 | ඉඩම් | 0 | 0 | 0 | 0 |
| | | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 0 | 0 | 0 | 0 |
| | | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | 0 | 0 | 0 | 0 |
| 9160 | කෙරීගෙන යන වැඩ | 0 | 0 | 0 | 0 |
| | | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | 0 | 0 | 0 | 0 |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. TPD/C/24/09/DMA/FA | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි දින |

ගණන්දීමේ නිලධාරී
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 324 - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 324 - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 අග්‍රිම කළමනාකරණය

2024 වර්ෂයේදී රු.64,078,000 ක අග්‍රිම ඉල්ලුම් කිරීමට සැලසුම් කර තිබුණද දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම රු.78,504,000ක් ඉල්ලුම්කර රු.63,446,000ක අග්‍රිම ලැබී තිබුණි. ඒ අනුව සැලසුම් කරන ලද අග්‍රිම වටිනාකමට වඩා සියයට 23ක් වැඩියෙන් භාණ්ඩාගාරයෙන් අග්‍රිම ඉල්ලා තිබුණි.

### 3.2 වියදම් කළමනාකරණය

#### 3.2.1 ප්‍රතිපාදන මාරු කිරීම්

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වැය විෂයන් 06 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.4,050,000ක් හෙවත් සියයට 9 සිට 31 දක්වා වූ පරාසයකින් ප්‍රතිපාදන අඩු කිරීම් ද වැය විෂයන් 08ක එකතුව රු.7,215,000කින් හෙවත් සියයට 06 සිට 100 දක්වා වූ පරාසයකින් ප්‍රතිපාදන වැඩි කිරීම් ද මු.රෙ.66 හා පරිපූරක ඇස්තමේන්තු මඟින් මාරු කිරීම් සිදු කර තිබුණි.

#### 3.2.2 ප්‍රතිපාදන ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වැය විෂයන් 08 ක් සඳහා සලසා තිබූ එකතුව රු.5,416,000ක ප්‍රතිපාදන වලින් රු.4,072,773ක් උපයෝජනය කර, එකතුව රු.1,343,227ක් ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 41 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

### 3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| යොමුව | නීති,රීති රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම |
|---|---|
| මු.රෙ.892 ප්‍රකාරව | ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් සැම වර්ෂ තුනක් අවසානයේදී පසුව යෙදෙන පෙබරවාරි 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ ඇප සංශෝධිත නිලධාරීන්ගේ වාර්තාවක් 2025 අප්‍රේල් මාසය වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 කාර්යභාරයන් ඉටුකිරීමේ ප්‍රගතිය

(අ) රාජ්‍ය අංශයේ අක්‍රමිකතා සොයා ගැනිමට අදාලව 2024 දෙසැම්බර් 31 වන විට දෙපාර්තමේන්තුවට ලැබී තිබු විගණනය වෙත ඉදිරිපත් කෙරුණු පැමිණිලි 71න් පැමිණිලි 26ක කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) 2024 ක්‍රියාකාරී සැලසුම අනුව රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වෙන බව තහවුරු කිරීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාර්යකි. එසේ වුවද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුලදී පවත්වා තිබූ විගණන කළමනාකරණ කමිටු 490න් 125කට දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගිවී නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| ආයතනයේ විස්තර | රැස්වීම් සංඛ්‍යාව | සහභාගි වී ඇති රැස්වීම් සංඛ්‍යාව | සහභාගි නොවූ රැස්වීම සංඛ්‍යාව |
|---|---|---|---|
| අමාත්‍යාංශ සහ අංශ | 126 | 125 | 01 |
| දෙපාර්තමේන්තුව | 180 | 108 | 72 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 100 | 85 | 15 |
| විශේෂ වියදම් ඒකක | 48 | 25 | 23 |
| පළාත් සභා | 36 | 22 | 14 |
| | 490 | 365 | 125 |

## 5. මානව සම්පත් කළමනාකරණ

දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව අනුමත තනතුරු සංඛ්‍යාව 50ක්වූ අතර ඉන් තනතුරු 12ක් පුරප්පාඩුව පැවතුනි. ඉන් පුරප්පාඩු 06ක්ම ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. එම පුරප්පාඩු තනතුරු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. 2024 වාර්ෂික ඇස්තමේන්තුව අනුව අනුමත තනතුරු සංඛ්‍යාව 49ක් ලෙස දක්වා තිබුණි.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | **90%- 100%** | **75%-89%** | **50%- 74%** |
| 01 | **අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය කිරීම**<br>අයවැය චක්‍රලේඛය අනුව පුහුණු වැඩ සටහන් පැවැත්වීමට භාණ්ඩාගාර ලේකම්තුමා වෙතින් විශේෂ අනුමැතිය ලබා ගැනීමට සිදුවීම හා ජාතික මැතිවරණ 2 ක් රටේ පැවැත්වීම හේතුවෙන් අපේක්ෂිත පුහුණු වැඩසටහන් සියල්ල පැවැත්වීමට නොහැකි විය. | | 83.5% | |
| 02 | **රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා ( COPA) ක්‍රියාකාරකම් තුළින් රාජ්‍ය අංශයේ වගවීම ශක්තිමත් කිරීම** | 100% | | |
| 03 | **අභ්‍යන්තර විගණන කටයුතු තුළින් විගණන හා කළමනාකරණ කමිටු (AMC) සුමටව ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය අංශයේ වගවීම ශක්තිමත් කිරීම සහතික කිරීම** | | 76% | |
| 04 | **රාජ්‍ය අංශයේ අක්‍රමිකතා සොයා ගැනීමට දායක වීම**<br>2024.12.31 වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අවසන් කර ඇති පැමිණිලි ප්‍රමාණය 45 ක් වන අතර තවදුරටත් අවසන් කිරීමට ඇති පැමිණිලි ප්‍රමාණය 26 ක් වේ.<br>2024 වර්ෂයේදී ලද පැමිණිලි ප්‍රමාණය 71<br>පරිපාලනමය ගැටලු සම්බන්ධ පැමිණිලි ප්‍රමාණය 31 | | | 63% |

| | | | | |
|---|---|---|---|---|
| | මූල්‍ය ගැටලු සම්බන්ධ පැමිණිලි ප්‍රමාණය 30<br>ප්‍රසම්පාදන ගැටලු සම්බන්ධ පැමිණිලි ප්‍රමාණය 5<br>වෙනත් ගැටලු සම්බන්ධ පැමිණිලි ප්‍රමාණය 5 | | | |
| 05 | **අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය විධිමත් කිරීම**<br>**ජාතික විගණන පනතට අනුව අභ්‍යන්තර විගණන වාර්තා රුස් කිරීම** | 100%<br>80% | | |
| 06 | **පළාත් පාලන ආයතනවල සහ පළාත් සභාවල අභ්‍යන්තර විගණන ඒකක විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම**<br>01. පළාත් සභාවල අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධව දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම<br>02. පළාත් සභා අභ්‍යන්තර විගණන ඒකක මගින් විගණන වාර්තා ලබා ගැනීම<br>03.කාර්තු වාර්තා සකස්කිරීම | 90% | 75%<br>75% | |
| 07 | රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයන්හි (SOE s) අභ්‍යන්තර විගණන ඒකක සමාලෝචනය | 85% | | |
| 08 | **මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ සංවර්ධනය කිරීම**<br>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විස්තරාත්මක මඟ පෙන්වීමක් ලබා දීම සඳහා ව්‍යාපෘති කළමනාකරණය හා සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ අදාල දෙපාර්තමේන්තුවල සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන්ගේ දායකත්වයෙන් හා එකඟතාවයෙන් ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය (Project Management Guideline) ඇතුළත් කළමනාකරණ විගණන චක්‍රලේඛ | 100% | | |

| | | | | |
|---|---|---|---|---|
| | අංක DMA/02/2024 නිකුත් කිරීම හා අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශ අංක DMA/01/2024 චක්‍රලේඛය නිකුත් කිරීම. | | | |
| **09.** | **අමාත්‍යාංශ යටතේ ඇති සංවර්ධන ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය කිරීම**<br>01. ව්‍යාපෘති අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්ෂික විගණන සැලැසුම් 12 ක් සමාලෝචනයට ලක් කර ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම.<br>02. ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ගැටලු නිරාකරණය කිරීම අරමුණින් ව්‍යාපෘති 30 ක් වෙනුවෙන් පවත්වන ලද ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් 42ක් සඳහා සහභාගි වීම.<br>03. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ දැනුම්දීම මත ප්‍රධාන විදේශ මූල්‍ය ව්‍යාපෘති 02 ක් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර නිරීක්ෂණ ද ඇතුලත්ව කාර්ය සාධන ඇගයීම් සිදු කරන ලද අතර හඳුනාගත් ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය වන නිර්දේශයන් ඉදිරිපත් කිරීම.<br>04. පුහුණු අංශය හා එක්ව පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්, පළාත් ප්‍රධාන විගණන අධ්‍යක්ෂවරුන්, අභ්‍යන්තර විගණකවරුන් සහ විගණන කාර්ය මණ්ඩලය සඳහා සංවර්ධන ව්‍යාපෘති විගණනය කිරීමේදී අවධානයට ලක්විය යුතු තාක්ෂණික කරුණු හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ වැඩමුළු 04 ක් පළාත් 04 ක පැවැත්වීමට කටයුතු කිරීම.<br>05. ව්‍යාපෘති සමබන්ධ කාර්තුමය අභ්‍යන්තර විගණන වාර්තා 78 ක් ඇගයීමකට ලක් කර අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීම | 100%<br>95%<br>100%<br>100%<br>100% | | |

## පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

5.1 අදාළ වන තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම

| අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක | අරමුණු | සාර්ථකත්වයේ දර්ශක | සාර්ථකත්වය ළඟා කර ගැනීමේ ප්‍රගතිය (%) | | |
|---|---|---|---|---|---|
| | | | 0-49 | 50-74 | 75- 100 |
| ඉලක්කය-09<br>ශක්තිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම. | තිරසාර යටිතල පහසුකම් සහ කාර්මිකරණයේ සමස්ත ඉලක්කයට දායක වන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තුළ සම්පත් කාර්යක්ෂම කළමනාකරණය සහ භාවිතය සහතික කිරීම. | විගණන මගින් හඳුනාගත් සම්පත් නාස්තියේ ප්‍රතිශතය අඩු කිරීම. | | | 83% |
| ඉලක්කය-16<br>තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ ඇතුළත් සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම සහ සියලු මට්ටම්වල ඵලදායී, වගවීමේ සහ පරිපූර්ණ ආයතනයක් ගොඩනැගීම. | විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සහ දායක වීම සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම මගින් විනිවිදභාවය, වගවීම සහ යහපාලනය සහිත ශක්තිමත් ආයතන ගොඩනැගීමට දායක වීම. | පවත්වන ලද විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් ගණන, 2024 වර්ෂය තුළ පැවැත්විය යුතුව තිබූ මුළු කමිටු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (365/480) | | | 76% |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉලක්කය-17<br><br>ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම, තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය පුනර්ජීවනය කිරීම. | තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන සහයෝගීතාවය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් කොටස්කරුවන් අතර සහයෝගීතාවය සහ දැනුම බෙදාගැනීම මගින් වර්ධනය කිරීම. | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන, සැලසුම් කළ වැඩසටහන් ගණනට දක්වන ප්‍රතිශතය. | | | 84% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

### 5.2.1 ජයග්‍රහණ

2024 වර්ෂය තුලදී අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා සහ විශේෂ වියදම් ඒකකයන්හි පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 480 න් 365 ක් සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු නියෝජිතයින් සහභාගී වූ අතර මේ මගින් මූල්‍ය, මානව සම්පත් හා භෞතික සම්පත් ඵලදායිව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් හා මඟපෙන්වීම් සිදුකරන ලදි. එමගින් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඍජුව හා වක්‍රව දායකත්වය ලබාදී ඇත.

අමාත්‍යාංශ 29 ක දෙපාර්තමේන්තු 46 ක පළාත් සභා 9, විශේෂ වියදම් ඒකක 12 ක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක කාර්තු 04 සඳහා පවත්වනලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගි වීමෙන් ආයතවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට හා අක්‍රමිකතා අවම කර කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහල නැංවීමට දායක වී ඇත.

දිවයිනේ සියලුම ආයතනවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් හා අභ්‍යන්තර විගණකවරුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම තුලින් කාර්යක්ෂම සේවයක් තම ආයතන වලට ලබා දීමට දායක වී ඇත. 2024 වර්ෂය තුල මෙම පුහුණු වැඩසටහන් 6 ක් පවත්වා ඇත.

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/ අභ්‍යන්තර විගණකවරුන්ගේ රාජකාරි කටයුතු වල ප්‍රගතිය සමාලෝචනය කිරීම මඟින් ඔවුන්ට පවතින ගැටලු මග හැර ගෙන කාර්යක්ෂම සේවයක් සැපයීමට සහ කාර්ය සාධනය ඉහල නැංවීමට අවශ්‍ය පියවර ගැනීම. ඒ යටතේ අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකක වල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් කැඳවා ඒ ඒ ආයතන සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 28 ක් පවත්වන ලදි.

- අමාත්‍යාංශ 12
- දෙපාර්තමේන්තු 07
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල 05
- පළාත් සභා 03
- විශේෂ වියදම් ඒකක 01

2024 වර්ෂයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා 47 ක් පැවැත්වීම සඳහා නිර්දේශ වී තිබුණද විවිධ හේතුන් නිසා එයින් කාරක සභා 07 ක් අවලංගු වී ඇත. ඒ අනුව තත්‍ය ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් 36 ක් පවත්වා ඇති අතර ඒ සඳහා මහා භාණ්ඩාගාර වාර්තා යැවිය යුතුව තිබූ

සියළුම වාර්තා මහා භාණ්ඩාගාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සඳහා සක්‍රිය දායකත්වයක් ලබාදෙනු ලබන දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් යවා ඇති අතර පැවැත්වූ කාරක සභා 36 සඳහාම දෙපාර්තමේන්තුව සක්‍රියව සහභාගී වී ඇත.

ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති 30 ක අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම ඉලක්ක කර ගනිමින් ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පැන නැගී ඇති ගැටලු නිරාකරණය කිරීම සම්බන්ධයෙන් පවත්වන ලද ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු 42 කට සහභාගී වී අවශ්‍ය දායකත්වය ලබාදීම මෙන්ම ප්‍රධාන විදේශ මූල්‍යාන ව්‍යාපෘති 02 ක පූර්ණ කාර්යසාධන ඇගයීමක් සිදු කර හඳුනාගත් ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ අදාළ පාර්ශවයන් වෙත ලබා දීම ද සිදු කරන ලදි .

අභ්‍යන්තර පාලන ක්‍රමවේද වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම තුලින් වඩාත් ඵලදායි ව්‍යාපෘති කළමනාකරණයක් උදෙසා මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමණාකරණය හා සම්බන්ධිත සියලුම දෙපාර්තමේන්තුවල පොදු එකඟතාවයකින් යුතුව ව්‍යාපෘති කළමනාකරණය ආශ්‍රිත සවිස්තරාත්මක මාර්ගෝපදේශයක් (කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/02/2024 -ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය) සකස් කර නිකුත් කිරීමට 2024 වසර තුල කටයුතු කරන ලදි.

එමෙන්ම රාජ්‍ය අංශයේ සංවිධානවල අරමුණුවලට බලපෑම් කලහැකි අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් ලෙස අවදානම් කළමනාකරණ රාමුවක් දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කර DMA/1-2024 චක්‍රලේඛය යටතේ හඳුන්වාදෙන ලදි. මෙමගින් පාලනය, මෙහෙයුම් අනුකූලතාවය, මූල්‍ය සහ කීර්තිනාමය වැනි අවදානම් ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම, වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සහතික කරනු ලබයි.

විවිධ ආයතනවල සිදුවන අක්‍රමිතා පිළිබඳව විමර්ෂණය කර නිර්දේශ ඉදිරිපත් කිරීම හා අභ්‍යන්තර පාලන ක්‍රමවේද නිසි අයුරින් යොදා නොමැති ආයතන සඳහා සුදුසු අභ්‍යන්තර යාන්ත්‍රණ නිර්දේශ කිරීම යන ක්‍රමවේද මගින් විවිධ ආයතන වල සිදුවිය හැකි අක්‍රමිකතා /අකාර්යක්ෂමතා අවම කර කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහල නැංවීමට දායකත්වය ලබා දී ඇත. මෙසේ විවිධ ආයතන වලට අදාල පැමිණිලි 23 ක් විමර්ෂණය කර සුදුසු නිර්දේශ ලබා දීමට කටයුතු කර ඇත.

- පරිපාලනමය අක්‍රමිකතා පිළිබඳව විමර්ෂණ 13
- මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව විමර්ෂණ 04
- ප්‍රසම්පාදන අක්‍රමිකතා පිළිබඳව විමර්ෂණ 05
- වෙනත් 01

### 5.2.2 අභියෝග

රජයේ වියදම් අරපිරිමැස්මෙන් යුතුව සිදුකළ යුතු වීම හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු සඳහා භෞතිකව සහභාගි වීමට නොහැකිවීම හා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් ඇතුලු නිලධාරීන් අතර තිරසර සංවර්ධන අරමුණු ලඟාකරගැනීමට තම කාර්යයන් කෙසේ බලපායිද යන්න පිළිබඳව ඇති අවබෝධය අඩු වීමද තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යන ගමනට අභියෝගයක් වේ. සියලුම රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටුවලට සහභාගි වීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුව සතුව නොසිටීම මෙන්ම පුහුණු සහාය කාර්යමණ්ඩලයක් නොමැති වීමද තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා දායක වීමට බාධා ඇති කරයි.

## පරිච්ඡේදය 06 - දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තාව තුල අවදානම් කළමනාකරණ රාමුව

### 6.1 පාලනය සහ උපාය මාර්ගික පෙළගැස්ම

අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ පළාත් සභා වල ඵලදායී අධීක්ෂණය තහවුරු කරමින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව එහි මූලික කාර්යයන් වලට අවදානම් කළමනාකරණ රාමුවක් සකස් කර ක්‍රියාත්මක කර ඇත. මෙම රාමුව ජාතික පාලන ප්‍රතිපත්ති සමග සමපාත වන අතර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු වලට විශේෂිත වූ අවදානම් හඳුනා ගැනීම, ඒවා ඇගයීම සහ ඒවායේ බලපෑම අඩු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහගත මගපෙන්වීම සපයයි.

### 6.2 දෙපාර්තමේන්තු අවදානම් සංස්කෘතිය සහ අවදානම් අභිරුචිය

#### 6.2.1 අවදානම පිළිබඳ දැනුවත් සංස්කෘතියක් ස්ථාපිත කිරීම

- දෛනික කටයුතු වලදී සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ඇතිවිය හැකි අවදානම ඇතුලත් කරමින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කර ඇත.
- අවදානම් කළමනාකරණ මූලධර්ම, අභ්‍යන්තර විගණන ක්‍රියාවලි, පුහුණු වැඩසටහන් සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලට අන්තර්ගත කර ඇත.
- අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සම්බන්ධ මුලපිරීම්, දෙපාර්තමේන්තු පාලන කටයුතු තුල අවදානම් කළමනාකරණය ඉතා වැදගත් අංගයක් බව තහවුරුකර ඇත.

#### 6.2.2 අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම

- විවිධ මෙහෙයුම් කටයුතු සඳහා වූ පිලිගත හැකි අවදානම් මට්ටම් හඳුන්වා දෙන අවදානම් අභිරුචි ප්‍රකාශයක් දෙපාර්තමේන්තුව මගින් නිර්වචනය කර ඇත.
- අවදානම් භාර ගැනීම සහ එහි බලපෑම අඩු කිරීම සඳහා සමබර ප්‍රවේශයක් තහවුරු කරමින් අවදානම් අභිරුචිය පහළ, මධ්‍යම හා ඉහළ දරාගැනීමේ මට්ටම් ලෙස වර්ග කරනු ලැබේ.
- රජයේ ප්‍රමුඛතාවන් සහ පරිනාමය වන අවදානම් පරිසර අනුව අවදානම් අභිරුචි මට්ටම් කාලානුරූපීව සමාලෝචනය කරනු ලැබේ.

## 6.3 අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම

### 6.3.1 දෙපාර්තමේන්තුවේ කාර්යන් සඳහා යොදා ගැනීම.

- වඩා ගැලැපෙන අවදානම් අවම කිරීමේ උපාය මාර්ග නිර්දේශ කරන සහ හඳුනාගත් අවදානම් පිළිබඳව සාකච්ඡා කරන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට මෙම රාමුව ඒකාබද්ධ කර ඇත.
- අභ්‍යන්තර විගණන ක්‍රියාවලීවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර විගණකවරුන්ට ලබා දී ඇති මඟපෙන්වීමේහි අවදානම් ඇගයීමේ ක්‍රමවේද අන්තර් ගත කර ඇත.
- අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තුල ඇති මූල්‍ය සහ  මෙහෙයුම් පාලන ක්‍රම ඇගයුම සඳහා මෙම රාමුව උපකාරි වේ.

### 6.3.2 පුහුණු හා ධාරිතා සංවර්ධනය

- දෙපාර්තමේන්තුගත අවදානම් හඳුනාගැනීමට සහ බලපෑම අඩුකිරීමේ හැකියාව ශක්තිමත් කිරීමට අභ්‍යන්තර විගණකයින් සඳහා අවදානම් කළමනාකරණ වැඩමුළු පවත්වන ලදී.
- විගණනය සැලැසුම් කිරීම,අනුකූලතාව අධීක්ෂණය සහ අභ්‍යන්තර වාර්තාකරනයට අදාළ අවදානම් පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂිත වූ පුහුණු ලබා දෙන ලදි.

### 6.3.3 මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මඟින්, අභ්‍යන්තර විගණනයේදී ක්‍රියාකාරි අවදානම් කළමනාකරණය අවධාරණය කිරීම සඳහා අවදානම් පාදක විගණන මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

මෙම මාර්ගෝපදේශ පහත සඳහන් කරුණු සාකච්ඡා කරයි.

- රජයේ මූල්‍ය ගනුදෙනු වලදී අවදානම හඳුනා ගැනීම.
- අභ්‍යන්තර විගණන කටයුතු වලදී අවදානම් පාදක ප්‍රමුඛතාකරණය
- අවදානම් පාදක ඇගයීම් හරහා අභ්‍යන්තර පාලන රාමු වැඩිදියුණු කිරීම.

## 6.4 අභ්‍යන්තර විගණනය සහ පාලන යාන්ත්‍රණය ඒකාබද්ධ කිරීම

### 6.4.1 අවදානම් පාදක අභ්‍යන්තර විගණන

- අවදානම් පාදක ඇගයීම් තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන්  විසින් සිය අභ්‍යන්තර විගණන සැළසුම් සහ වාර්තා, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ ජාලගත අභ්‍යන්තර විගණන කළමනාකරණ පද්ධතිය වෙත යොමු කළ යුතුය.

- දෙපාර්තමේන්තු මූල්‍ය ගනුදෙනු සහ අනුකූලතා ඇගයීම් වල පවතින ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍ර හඳුනාගැනීමේදී මෙම රාමුව ඉවහල් වී ඇත.

### 6.4.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ඒ ඒ දෙපාර්තමේන්තුවලට අදාල ප්‍රතිපාදන වෙන් කිරීම්, විගණන ඵලදායීතාව සහ පාලන කටයුතුවලට අදාල ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ සාකච්ඡා කිරීම සිදු කෙරේ.
- දෙපාර්තමේන්තුවේ ඩිජිටල් විගණන වේදිකාව හරහා යොමු කර ඇති අවදානම් ඇගයීමේ වාර්තා පදනම් කරගෙන අමාත්‍යාංශ සඳහා ක්‍රියාවට නැංවිය හැකි නිර්දේශ ලබා දෙනු ලැබේ.

## 6.5 හඳුනාගත් ප්‍රධාන අවදානම් සහ ඒවා අවම කිරීමේ උපාය මාර්ග

### 6.5.1 දෙපාර්තමේන්තු කාර්යයන්ට අදාල ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර

- **මෙහෙයුම් අවදානම්**
  - විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සම්බන්ධීකරණ අකාර්යක්ෂමතා, විගණන මාර්ගෝපදේශ නිකුත් කිරීමේ ප්‍රමාදයන් සහ පුහුණු වැඩසටහන් සඳහා පවතින සම්පත් වල සීමාවන්.
- **අනුකූලතා සහ නීතිමය අවදානම**
  - විගණන වාර්තා කිරීමේ කාලසීමාවන්ට අනුකූල නොවීම , විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් ප්‍රමාණවත් නොවීම, අවදානම් වාර්තාකරණයේ නොගැලපීම්
- **උපාය මාර්ගික අවදානම**
  - දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ මූලපිරීම් වඩාත් පුළුල් ජාතික ප්‍රතිපත්ති සමග පෙළගැස්වීමේ අභියෝග
- **කීර්ති නාමය පිළිබඳ අවදානම**
  - විගණන විමසුම් සඳහා ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීම හේතුවෙන් පැන නගින අවදානම හා වගවීම ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීමෙන් පැනනගින අවධානම්
- **දේශපාලනික/ භූ දේශපාලනික අවදානම්**
  - දෙපාර්තමේන්තුවේ විගණන අධීක්ෂණ ක්‍රියාවලීන් ඵලදායීව ක්‍රියාවට නැංවීමේ හැකියාවට බලපාන බාහිර පීඩන.

### 6.5.2 අවදානම් අවම කිරීමේ උපාය මාර්ග

- විගණන නිර්දේශ සම්බන්ධයෙන් කලට වේලාවට පසු විපරම් කරන බවට තහවුරු කර ගැනීම සඳහා ශක්තිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක්.

- විගණන ප්‍රගතිය තත්‍ය කාලීනව ලබා ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කළමනාකරණ පද්ධතිය තුළින් වැඩිදියුණු කළ අවදානම් වාර්තාකරණ ව්‍යුහයක්.

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, අභ්‍යන්තර විගණන පුහුණු සහ අවදානම් පාදක මූල්‍ය අධීක්ෂණය සඳහා විශේෂයෙන් ගොඩනංවනලද අවදානම් අභිරුචි ප්‍රකාශයක්.

- අවදානම් ක්ෂේත්‍ර වල බලපෑම අඩු කිරීම සහ පාලන ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට ස්ථාපිත කරන ලද හඳුනාගැනීමේ, වැළැක්වීමේ හා නිවැරදි කිරීමේ පාලන ක්‍රමවේද.

## 6.6 කාර්ය සාධන ඇගයීම සහ බලපෑම

### 6.6.1 දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයට දායකවීම

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සම්බන්ධීකරණය වැඩියුණු කිරීම තුළින් අවදානම් අවම කිරීමේ ක්‍රියාවන් ක්‍රමානුකූලව හඳුනාගැනීම.
- අභ්‍යන්තර විගණන වාර්තාකරණ අවශ්‍යතාවයන් සඳහා අනුකූල වීම ඩිජිටල් වේදිකාවක් තුළින් වැඩිදියුණු කිරීම.
- දෙපාර්තමේන්තුව තුල අවදානම් හා බැඳුණු තීරණ ගැනීමේ ක්‍රියාවලියේ විනිවිද භාවය ඉහළ නැංවීම.

### 6.6.2 ජයග්‍රහණ

- වෙබ් පාදක අභ්‍යන්තර විගණන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මගින් අවදානම් පාදක විගණන ඉදිරිපත් කිරීම සහ දත්ත නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම විධිමත් කර ඇත.
- දෙපාර්තමේන්තු මූල්‍ය කළමනාකරණ පද්ධතියට යොදාගන්නා ලද අවදානම අවම කිරීමේ උපාය මාර්ග, එහි පාලන නිමැවුම් වැඩිදියුණු කිරීමට බලපා ඇත.

## 6.7 අභියෝග හා අනාගත වැඩිදියුණු කිරීම්

### 6.7.1 ක්‍රියාත්මක කිරීමේ අභියෝග

- අවදානම් කළමනාකරණ මෙවලම් ඵලදායීව යෙදවීමට දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයේ හා අභ්‍යන්තර විගණක වරුන්ගේ ධාරිතාවය තවදුරටත් ඉහළ නැංවීමේ අවශ්‍යතාවය.
- තත්‍යකාලීන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අවදානම් දත්ත ඒකාබද්ධ කිරීම සීමාසහිත වීම.

### 6.7.2 ඉදිරි වැඩිදියුණු කිරීම්

- අවදානම් වාර්තාකරණ ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා ජාලගත අවදානම් කළමනාකරණ පද්ධතිය පුළුල් කිරීම
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, විගණන ඵලදායීතාව හා මූල්‍ය පාලන කටයුතු පිළිබඳ අවදානම් අධීක්ෂණය සඳහා අන්තර් ක්‍රියාකාරී අවදානම් මෙවලම් පුවරුවක් සංවර්ධනය කිරීම
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා අලුතින් පැනනගින අවදානම්ද අන්තර්ගත කිරීම සඳහා අවදානම් රාමුවට අවශ්‍ය නිරන්තර යාවත්කාලීන කිරීම් සිදුකිරීම

### 6.8 නිගමනය

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට, විශේෂයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, අභ්‍යන්තර විගණකවරුන් පුහුණු කිරීම සහ මූල්‍ය අධීක්ෂණ කටයුතු වලට අදාල අවදානම් අධීක්ෂණය ශක්තිමත් කිරීමට දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ රාමුව ඉවහල් වී ඇත. ඩිජිටල් මෙවලම්, පුහුණුව සහ ප්‍රතිපත්ති සංවර්ධනය තුල අඛණ්ඩ වැඩිදියුණු කිරීම්, රාජ්‍ය අංශයේ පාලනයට සහාය වන තිරසාර අවදානම් කළමනාකරණ පිළිවෙත් සහතික කරනු ඇත.

# පරිච්ඡේදය 07 - මානව සම්පත් පැතිකඩ

## 7.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 17 | 11 | 06 |
| තෘතීයික | - | - | - |
| ද්විතියික | 23 | 21 | 02 |
| ප්‍රාථමික | 10 | 06 | 04 |

## 7.2** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපා ඇති ආකාරය

- **ජ්‍යෙෂ්ඨ :** පුරප්පාඩු 06 ක් පැවතියද අනෙකුත් නිලධාරීන් රාජකාරී ආවරණය කරන ලද බැවින් ආයතනයේ කාර්ය සාධනයට විශාල බලපෑමක් ඇති නොවන පරිදි කාර්යයන් කළමනාකරණය කරගත හැකිවිය.

- **ද්විතියික :** පුරප්පාඩු 02 ක් පැවතියද අනෙකුත් නිලධාරීන් රාජකාරී ආවරණය කරන ලද බැවින් ආයතනයේ කාර්ය සාධනයට විශාල බලපෑමක් ඇති නොවිය.

- **ප්‍රාථමික :**
    - **රියදුරු :** ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් වෙන් කළ නිල වාහන ඉල්ලා නොමැති බැවින් සංචිත වාහන සඳහා පමණක් ආයතනයේ රියදුරන් යෙදවූ අතර එමගින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සඳහා රියදුරන්ගේ පුරප්පාඩු බලපා නැත.

## 7.3 මානව සම්පත් සංවර්ධනය (විදේශ පුහුණු වැඩසටහන්)

| නිලධාරියාගේ නම | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු1,203,869.32) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 01.යු.පී. විජයසේවා මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ | Seminar on Capacity Building for Think Tanks from BRI Countries | 01 | 2024.04.09 2024.04.22 | 28,791.00 115,104.07 | - | විදේශීය | Knowledge of shared development of the BRI. Strengthening poverty alleviation cooperating under BRI and enhancing global trade and infrastructure connectivity |
| 2.ඞී.එන්.එස්. වැලිකල මිය - අධ්‍යක්ෂ | Seminar on Enhancing Performance of Young Officials in Developing Countries | 01 | 2024.03.29 2024.04.11 | 29,238.37 116,064.87 | - | විදේශීය | Development knowledge on National Governance Practices |
| 3.ඒ.පී. කුරුම්බලපිටිය මයා- අධ්‍යක්ෂ ජනරාල් | ADB: Beneficial Ownership for Tackling illicit Financial Flows Workshop | 01 | 2024.07.03 2024.07.05 | 39,633.71 | - | විදේශීය | The lessons learned and new knowledge acquired will help stakeholders to implement more effective measures to prevent illicit financial flows and promote a transparent and fair financial system. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4. කේ.ඒ.එස්. මනෝප්‍රිය මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ | Seminar on Optimization of Business Environment for Chambers of Commerce and Industry BRI Partner Countries | 01 | 2024.07.10<br>2024.07.23 | 29,633.71<br>117,293.10 | - | විදේශීය | Knowledge on optimizing the business environment in China. |
| 5.පී.පී. චම්පිකා මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Seminar on investment Cooperation and Developing Countries | 01 | 2024.07.11<br>2024.07.24 | 29,693.25<br>117,216.08 | - | විදේශීය | Knowledge on shared development and key fields of investment cooperation industrialization process and practices in China |
| 6.අයි.ජේ. අබේරත්න මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Seminar on Leadership management of Government Officials for Belt and Road Countries | 01 | 2024.07.16 -<br>2024.07.29 | 29,859.33<br>116,388.18 | - | විදේශීය | Essential capabilities and qualities that are being amalgamated into capacity building of civil servants. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 7.බී.ජී. තිසාර මයා - අධ්‍යක්ෂ | Seminar on Developing Countries Sustainable Development Capacity and South – South Cooperation for Sustainable Development | 01 | 2024.08.30<br>2024.09.12 | 30,348.81<br>115,810.57 | - | විදේශීය | China's foreign diplomacy Foreign Trade Policy and international Economic development for sustainable development. |
| 8. එන්.ඩී.සී.පී නාකන්දල මිය - අධ්‍යක්ෂ | Seminar on Governance Capability for China "Belt & Road" Countries | 01 | 2024.09.17<br>2024.09.30 | 30,102.99<br>115,906.83 | - | විදේශීය | Understanding reasons contributed to China's high economic growth and applicability to Sri Lanka |
| 9.ජී.ඒ.ජී.ටී. ගනේපොල මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ | Seminar on Application and Management of PPP Model for Sri Lanka | 01 | 2024.10.11 -<br>2024.10.24 | 30,046.16<br>112,738.29 | - | විදේශීය | Understanding of China's History & Culture, Chinese policies and strategies for its development by using the PPP model |

## 7.4 මානව සම්පත් සංවර්ධනය (දේශීය පුහුණු වැඩසටහන්)

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) 54000/= | | වැඩසටහන නේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Google Form සම්බන්ධ පුහුණුව | 19 | 2024.04.08 | - | | දේශීය | Google Form පිළිබඳ දැනුම |
| තෘප්තිමත් වැඩ පරිසරයක් තුළින් කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය ඉහල නැංවීම | 25 | 2024.05.04 | - | | දේශීය | රාජකාරි කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට කටයුතු කලයුතු ආකාරය පිළිබඳ දැනුම |
| විශේෂ විමර්ශණ පිළිබද පුහුණු වැඩසටහන | 28 | 2024.05.09 | - | | දේශීය | විශේෂ විමර්ශණ පැවැත්වීම පිළිබඳ දැනුම |
| Training Programme on Government Payroll system | 01 | 2024.06.03,04,05 | 18,000/= | | දේශීය | Payroll පද්ධතිය හරහා වැටුප් සකස්කිරීම පිළිබඳ දැනුම |
| Improving Accounting | 02 | 2024.06.05 | 14,000/= | | දේශීය | ගිණුම් කටයුතු සම්බන්ධ දැනුම |
| Role & Responsibilities of Officer in Charge of Leave | 01 | 2024.06.12 | 5,000/= | | දේශීය | නිවාඩු ලිපිකරු කාර්යභාරය පිළිබඳ දැනුම |
| Effective Handling of Personal Files | 02 | 2024.06.24 | 10,000/= | | දේශීය | පෞද්ගලික ලිපිගොනු නඩත්තුව පිළිබඳ දැනුම |
| Leave Allowance Procedure for Foreign Training | 01 | 2024.08.02 | 7,000/= | | දේශීය | විදේශ පුහුණු පාඨමාලාවලට සහභාගී වන නිලධාරින්ට නිවාඩු හා දීමනා ලබාදීම සම්බන්ධ දැනුම |
| 03/2016 වැටුප් චක්‍රලේඛය අනුව වැටුප් සකස් කිරීම- 1 වන වැඩසටහන | 18 | 2024.08.22 | - | | දේශීය | වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම |
| 03/2016 වැටුප් චක්‍රලේඛය අනුව වැටුප් සකස් කිරීම-2 වන වැඩසටහන | 08 | 2024.09.27 | - | | දේශීය | වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම |

## පරිච්ඡේදය 08 – අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ /ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | | | |
| 2 | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN –20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | ආයතනය තුල මූල්‍ය බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව , රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිවරයාගේ පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල නොවේ. | භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වෙනම අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් විගණන සැලැස්ම පිළියෙළ කර ඒ අනුව විගණන කටයුතු සිදු කරනු ලබයි | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ 134(2) සහ DMA -1/2019 අනුව වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත | අනුකූල නොවේ. | භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වෙනම අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් විගණන සැලැස්ම පිළියෙළ කර ඒ අනුව විගණන කටයුතු සිදු කරනු ලබයි | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ. | භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වෙනම අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් විගණන සැලැස්ම පිළියෙළ කර ඒ අනුව විගණන කටයුතු සිදු කරනු ලබයි | |
| 6.4 | මු.රෙ. 134 (3) අනුව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ. | මෙම දෙපාර්තමේන්තුවට අදාළව අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරයි. ඒ අනුව මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් එම අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත යොමු කරනු ලැබේ. | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම | අනුකූල නොවේ. | මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලබයි | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරිම | | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය අනුව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 ට අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා හා ඌණතා සහ වෙනත් නිර්දේශ අදාල කාලය තුල ක්‍රියාත්මක කර තිබිම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහබරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම | | | |
| 9.6 | කල්බදු කාල සීමාව සම්පූර්ණ වාහන වල අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර, සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග සැසදීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම | අදාල නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාල නොවේ | | |
| 15.3 | මු.රෙ 176 ප්‍රකාරව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරිම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ඒ තුලින් මහජනයාගේ ප්‍රශංසා හා චෝදනා පල කිරිමට ද පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2008 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සේවාලාභීන්ට සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | අනුකූල වේ | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 හි ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ | 2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 (i) 03 ඡේදය අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |